# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 දෙසැම්බර් මස 04 වන දින**

**II වන කොටස**

## අතිරේකය

**(2015.12.04 දින නිකුත් කරන ලදී)**

# බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන)

**(318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

බුද්ධ ශාසන අමාත්‍යතුමාගේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 23.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 2 වන වගන්තිය අළුත් යෙදුම් ගණනාවක් අර්ථ නිරූපනය කිරීමෙන් සහ දැනට පවතින්නා වූ ඇතැම් අර්ථ නිරූපනයන් සම්බන්ධයෙන් වන අදාළත්වයේ ක්ෂේත්‍රය පුළුල් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඒ ආඥාපනත යටතේ නිදහස් කරනු ලැබීම නොතකා, සෑම බෞද්ධ සිද්ධස්ථානයක් ම සහ දේවාලයක් ම ලියාපදිංචි කළ යුතු බවට විධිවිධාන සැලසීම ද වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එහි නීතිය බලපෑම වනුයේ, කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල නිශ්චිතව ම සඳහන් කිරීම ය.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එය 5 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දියවඩන නිළමේවරයා භාරකාරත්වය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ උපදෙස් මත දැරිය යුතු බව, දියවඩන නිළමේවරයා පත්කිරීමේ රැස්වීමට පැමිණෙන සාමාජිකයන්ගේ සංයුතිය වෙනස් කිරීම සහ එම රැස්වීමට කැඳවිය යුතු කාලසීමාව අවස්ථානුකූලව වෙනස් කිරීම ද ඇතුළු විධිවිධාන සැලසීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 7අ වගන්තිය ඇතුළත් කරන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ දියවඩන නිලමේවරයා එම ධුරය දරමින් සිටිය දී බස්නායක නිලමේ ධුරයක් දැරීම වළක්වාලීම ය.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ බස්නායක නිළමේවරයකු පත් කිරීම සඳහා සහභාගි වන සාමාජිකයන්ගේ සංයුතිය වෙනස් කිරීම ය.

***9 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් නව 8අ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර, එහි නීතිය බලපෑම වනුයේ, එක් දේවාලයක බස්නායක නිළමේවරයකුට එම ධුරය දරන අතරතුර වෙනත් දේවාලයක බස්නායක නිළමේ ධුරයක් දැරීම වළක්වාලීම ය.

***10 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මල්වත්ත විහාරය සහ අස්ගිරි විහාරය පිළිබඳ සඳහන් කිරීම මල්වතු පාර්ශ්වයට සහ අස්ගිරි පාර්ශ්වය යනුවෙන් සඳහන් කිරීම ය.

***11 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දියවඩන නිළමේවරයාගේ ධුරකාලය සීමා කිරීම ය.

***12 වන වගන්තිය*** : මෙම වගන්තිය 1981 අංක 18 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනතේ 3 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***13 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඩ මුදලේ ප්‍රමාණය වැඩි කිරීම ය.

*14 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, භාරකරුවකු වීමට ඇති සුදුසුකම් වැඩි කිරීම ය.

*15 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නිශ්චිතව සඳහන් අවස්ථාවල දී කොමසාරිස් ජනරාල්වරයාට දියවඩන නිලමේවරයා ඉවත් කිරීමට හැකි කරවීම ය.

*16 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සතර මහා දේවාලයේ බස්නායක නිළමේවරයකුට දියවඩන නිළමේ වෙනුවට වැඩ බැලීමට එම ධුරයේ පුරප්පාඩුවක් ඇතිවිට හැකි කරවීම ය.

*17 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සමහර අවස්ථාවල දී නිත්‍ය භාරකරුවකුගේ බලතල සහිතව තාවකාලික භාරකරුවකු පත් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකි කරවීම ය.

*18 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඬ මුදලේ ප්‍රමාණය වැඩි කිරීම ය.

*19 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 20අ වන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඇතුළත් කරන ලද නව වගන්තියේ නීතිය බලපෑම වනුයේ කාරක සංඝ සභාවේ තීරණයක් අනුව විහාරාධිපති ධුරය හෝ පාලක විහාරාධිපති ධුරය දරන අයකු සිද්ධස්ථාන දේපළෙන් ඉවත් වූ පසු එම දේපළ නව විහාරාධිපති හෝ පාලක විහාරාධිපතිට පැවරිය යුතු බව.

*20 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සමහර අවස්ථාවල දී හැර භික්ෂූන්වහන්සේ නමක් සිය පාවිච්චිය සඳහා අත්පත් කරගනු ලබන පෞද්ගලික දේපළ සිද්ධස්ථානයේ දේපළක් ලෙස සළකනු ලැබිය යුතු වීම ය.

*21 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඬ මුදලේ ප්‍රමාණය වැඩි කිරීම ය.

*22 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පරවේණි දේපළ පැවරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය දැක්වීම ය.

*23 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ සහ 28ආ දක්වා වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම ඇතුළත් කරන ලද වගන්තිවල නීතිය බලපෑම වනුයේ, අනවසර සන්තකය දරන්නකුගෙන් හෝ අනවසර පදිංචිකරුවකුගෙන් සිද්ධස්ථාන දේපළ ආපසු ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම ය.

*24 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ දඬ මුදල් ප්‍රමාණය වැඩි කිරීම සහ බදුකරයක ඇතුළත් කළ යුතු ප්‍රතිඥාවන් නිශ්චිතව දැක්වීම ය.

*25 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඬ මුදල් ප්‍රමාණය වැඩි කිරීම ය.

*26 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඬ මුදල් ප්‍රමාණය වැඩි කිරීම ය.

***27 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඩ මුදල් ප්‍රමාණය වැඩි කිරීම ය.

***28 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අටමස්ථාන සභාවේ සාමාජිකයකු වීම සඳහා සාමාන්‍ය සුදුසුකම් නිශ්චිතව දැක්වීම ය.

***29 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කොමසාරිස් ජනරාල්වරයා වෙත ආකෘති යැවීමේ කාලය දීර්ඝ කිරීම සහ මහනායක මාහිමිපාණන් වෙත පැවරී තිබූ කාර්ය භාරය ඉවත් කිරීම ය.

***30 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දඩ මුදල් ප්‍රමාණය වැඩි කිරීම ය.

***31 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නියෝග සෑදිය යුතු අළුත් ක්ෂේත්‍ර නිශ්චිතව දැක්වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය දැක්වීම ය.

***32 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 43අ වන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ ඇතුළත් කරන ලද වගන්තියේ නීතිය බලපෑම වනුයේ, යම් නියෝගවලට යටත් තැනැත්තකුගේ කාර්ය වනුයේ 43 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග පිළිපැදීම බවට විධිවිධාන සැලසීම ය.

# බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 20/2014.

## (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය. සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 2015 අංක    දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ 23 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 28අ සිට 28ඕ දක්වා වගන්ති අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

*(318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ''භික්ෂූන් වහන්සේ'' යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

> ''අටමස්ථාන'' යන්නෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී මහාබෝධිය, රුවන්වැලි සෑය, ජේතවනාරාමය, අභයගිරිය, ථූපාරාමය, මිරිසවැටිය, ලංකාරාමය සහ ලෝවාමහාපාය අදහස් වේ;

(2) ''භික්ෂූන් වහන්සේ'' යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

> ''භික්ෂූන් වහන්සේ'' යන්නෙන්, පිළිගත් ථෙරවාදී සම්ප්‍රදායානුගත උපසම්පන්න භික්ෂූන් වහන්සේනමක් හෝ සාමණේරයන් වහන්සේනමක් අදහස් වේ;

(3) ''බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් - ජනරාල්වරයා'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

2—PL 009405—425 (2015/11)

''පාලක විහාරාධිකාරී'' යන්නෙන්, යම් විහාරස්ථානයක විහාරාධිපති හිමියන් විසින් හෝ අදාළ විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වන විට එකී මහා නායක මාහිමිපාණන් විසින් හෝ, අවස්ථාවෝචිත පරිදි එම විහාරාධිපති හිමියන් හෝ මහානායක මාහිමිපාණන් වහන්සේගේ කැමැත්ත ඇති තාක් කල් එම විහාරස්ථානයේ පරිපාලන කටයුතු සිදු කිරීමට බලය පවරන ලද භික්ෂූන් වහන්සේ නමක් අදහස් වේ;

(4) ''අධිකරණය'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

''උඩරට පළාත'' යන්නෙන්, මොරවක කෝරලේ සහ හිනිදුම් පත්තුවට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසද ඇතුළු 1952 අංක 44 දරන උඩරට විවාහ සහ දික්කසාද පනතේ පළමුවන උපලේඛනයේ සහ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශ අදහස් වේ;

(5) ''පරවේණි පංගුව'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

''පරවේණි නිලකරු'' යන්නෙන්, සිද්ධස්ථානයට හෝ නින්දගම හිමිකරුවකුට යම් නිශ්චිත සේවාවන් ඉටු කිරීමට යටත්ව නිත්‍ය වශයෙන් පරවේණි පංගු දරන්නෙකු අදහස් වේ;

(6) ''සිද්ධස්ථානය'' යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

''සොළොස්මස්ථාන'' යන්නෙන්, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ පිහිටි උත්තරාරාමය හෙවත් ගල් විහාරය, දෙමළ මහා සෑය, කිරිවෙහෙර, ජේතවනාරාමය හෙවත් තිවංක පිළිමගෙය, ලංකාතිලකය, රන්කොත් වෙහෙර හෙවත් රත්නමාලී ථූපය, වටදාගෙය සහිත දළදා මළුව, ථූපාරාමය, ආලාහණ පිරිවෙණ, බද්ධ සීමාව,

නයිපෙණ විහාරය, මැණික් වෙහෙර, පබළු වෙහෙර, පොත්ගුල් වෙහෙර, තෝපා වැව දගැබ, මැදිරිගිරිය වටදගෙය අදහස් වේ;

(7) ''සිද්ධස්ථානය'' යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

''සිද්ධස්ථානය'' යන්නෙන්, මේ ආඥාපනතේ පරිපාලනය සහ කළමනාකාරීත්වය යටතේ ඇති ශ්‍රී ලංකාවේ පිළිගත් ථෙරවාදී සම්ප්‍රදායට අයත් වූ යම් විහාරයක්, දගැබක්, භික්ෂු ආවාසයක්, යම් බෞද්ධ වන්දනීය සිද්ධස්ථානයක් අදහස් වන අතර, ඊට මහනුවර ශ්‍රී දළදා මාලිගාව, ශ්‍රී පාදස්ථානය, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි අටමස්ථානය සහ පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි සොළොස්මස්ථානය සහ මේ පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පාලනය වන දේවාල ද ඇතුළත් වේ;

(8) ''සිද්ධස්ථානය'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිති ව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

''සිද්ධස්ථාන ඉඩම්'' යන්නෙන්—

(අ) යම් අධිකරණයක තීරණය ප්‍රකාර, සන්නස්, ඔප්පු හෝ වෙනත් ආකාරයකින් යම් සිද්ධස්ථානයකට පවරනු ලබන සහ මෙම ආඥාපනත යටතේ යම් සිද්ධස්ථානයක භාවිතය සඳහා වෙන්කොට ඇති සියලු ඉඩම්;

(ආ) භික්ෂූන් වහන්සේ නමකගේ අපවත්වීම හෝ උපැවිදි වීම හේතුවෙන් යම් විහාරස්ථානයකට අයත් වන යම් ඉඩමක් සිද්ධස්ථානයට අයත්වන ඉඩමක්;

(ඇ) යම් ඉඩමක දීර්ඝ කාලීන භුක්තිය හේතුවෙන් සිද්ධස්ථානයට අයත් වන ඉඩමක්; සහ

(ඈ) යම් සිද්ධස්ථානයකට පූජා කරනු ලබන යම් ඉඩමක්,

අදහස් වේ.

(9) ''විහාරාධිපති'' යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

''විහාරාධිපති'' යන්නෙන්, දේවාලයක් හැර යම් සිද්ධස්ථානයක, අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ සම්ප්‍රදයනට අනුකූලව විහාරාධිපති ධූරයට හිමිකම් ලැබූ භික්ෂූවහන්සේ නමක් හෝ එවැනි සම්ප්‍රදයානුකූල හිමිකමක් නොමැති අවස්ථාවක අදාළ නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් යම් සිද්ධස්ථානයක විහාරාධිපති ලෙස පත් කරනු ලැබූ භික්ෂූන් වහන්සේ නමක් අදහස් කෙරේ. මහනුවර ශ්‍රී දළද මාළිගාවේ විහාරාධිපති යන්නෙන් මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ මල්වතු සහ අස්ගිරි පාර්ශ්වයන් දෙකෙහි මහානායක මාහිමිපාණන් වහන්සේලා දෙනම අදහස් කෙරේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කිරීමෙන්:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''3. (1) මෙම ආඥපනතේ විධිවිධාන ශ්‍රී ලංකාවේ සියලුම සිද්ධස්ථානවලට අදාළ විය යුතු ය:

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මහනුවර ශ්‍රී දළද මාළිගාව, ශ්‍රී පාදස්ථානය, අටමස්ථානය සහ සොළොස්මස්ථානය හැර යම් විහාරස්ථානයක් මෙම ආඥපනතේ සියලුම විධිවිධාන හෝ කිසියම් විධිවිධානයක් අදාළ වීමෙන් බැහැර කරනු ලැබිය හැකි ය.”

(2) (1) වන උපවගන්තියෙන් ප්‍රදනය කොට ඇති නිදහස් කිරීම නොතකා, ශ්‍රී ලංකාවේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් තුළම පිහිටා ඇති සෑම විහාරස්ථානයක්ම, සෑම දේවාලයක්ම සහ කෝවිලක්ම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) අදාළ විහාරස්ථානයේ විහාරාධිපති විසින් ඉහත (2) වන උපවගන්තිය යටතේ එම විහාරස්ථානය ලියාපදිංචි කිරීම සඳහා අදාළ විය හැකි සියලු තොරතුරු අදාළ පාර්ශ්වයේ හෝ නිකායේ මහනායක ස්වාමීන්වහන්සේ මගින් කොමසාරිස් - ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් - ජනරාල්වරයා විසින් අදාළ පාර්ශ්වවල හෝ නිකායවල මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ අනුමතය මත විහාරස්ථානය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ එසේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව කොමසාරිස් - ජනරාල්වරයා විසින් එම ලියාපදිංචිය ස්ථිර කරමින් එවැනි සෑම විහාරස්ථානයකම විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

“කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල.

5. සෑම භාරකරුවකුම, විහාරාධිපති භික්ෂුවක් ම සහ සෑම පාලක විහාරාධිපති භික්ෂුවක් ම, මෙම ආඥාපනතේ විධිවිධාන මගින් බලය පවරා ඇතිතාක් දුරට, කොමසාරිස් - ජනරාල්වරයාගේ සාමාන්‍ය අධීක්ෂණයට යටත් වන්නේ ය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ඉවත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

“(1) මහනුවර ශ්‍රී දළඳ මාළිගාවේ භාරකාරත්වය දියවඩන නිළමේවරයා විසින් දැරිය යුතු අතර ඔහු මල්වතු පාර්ශවයේ

මහානායක මාහිමිපාණන් වහන්සේගේ සහ අස්ගිරි පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වහන්සේගේ උපදෙස් මත සිය භාරකාර ධුරයේ කටයුතු ඉටු කරනු ලැබිය යුතු ය.''

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

''(2) (අ) දියවඩන නිළමේ තනතුර පුරප්පාඩු වන කවර හෝ අවස්ථාවක,

(i) මල්වතු පාර්ශ්වයේ සහ අස්ගිරි පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වහන්සේලා ඇතුළු මල්වතු සහ අස්ගිරි පාර්ශ්වවල විංශද්වර්ගික කාරක සංඝ සභා දෙකේ සියලුම සාමාජික භික්ෂූන් වහන්සේලා:

එසේ වුව ද, විංශද්වර්ගික කාරක සංඝ සභා දෙකේ සංයුතියෙහි පවතින යම් පුරප්පාඩුවක මේ වගන්තිය යටතේ ගනු ලබන තීරණයකට බලනොපෑ යුතු ය;

(ii) මහනුවර ශ්‍රී දළඳ මාළිගාවට සම්බන්ධ සතර මහා දේවාලවල බස්නායක නිළමේවරුන්; සහ

(iii) තත්කාලයේ මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ධුරය දරන තැනැත්තා,

යන එක් එක් තැනැත්තාට රැස්වීමක් සඳහා මහනුවරට පැමිණෙන ලෙස, එම රැස්වීම සඳහා නියම කරගත් දිනට එක් මසකට නොඅඩු කාලයකට පෙර කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ලිඛිත දැන්වීමක්, ඉහත කී එක් එක් තැනැත්තා අවසන්වරට පදිංචි ස්ථානයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(ආ) තැපැල් දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය එසේ ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(ඇ) කොමසාරිස් - ජනරාල්වරයා විසින් මෙම උපවගන්තියේ සඳහන් කර ඇති රැස්වීම, දියවඩන නිලමේ තනතුර නියමිත ධුර කාලය සම්පූර්ණ වීමෙන් පුරප්පාඩු වන්නේ නම් එසේ පුරප්පාඩු වීමේ දිනයට පූර්වයෙන් තෙමසක් ඇතුළත හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු වූයේ නම් එසේ පුරප්පාඩු වී තෙමසක් ඉකුත් වීමට පෙර පැවැත්විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

''දියවඩන නිලමේ ධුරයට පත් කරනු ලැබූ කිසිම තැනැත්තකු එම ධුරය දරන අතරතුර දේවාලයක බස්නායක නිලමේ ධුරය නොදැරිය යුතු බව.

7අ. මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ ධුරය දරන යම් තැනැත්තකු එම ධුරය දරන අතරතුර, යම් දේවාලයක බස්නායක නිලමේ ධුරය නොදැරිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''(2) (අ) බස්නායක නිලමේ තනතුරකට පුරප්පාඩුවක් ඇති වන යම් අවස්ථාවක, කොමසාරිස් - ජනරාල්වරයා විසින් එම දේවාලය පිහිටා ඇත්තේ කවර පරිපාලන දිස්ත්‍රික්කයක ද, එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි යම් ස්ථානයකට පහත සඳහන් පුද්ගලයන්, එනම් -

(i) එම දේවාලය පිහිටි දිස්ත්‍රික්කයේ තත්කාලයේ ප්‍රාදේශීය ලේකම්ධුරය දරන සියලු තැනැත්තන්;

(ii) එම දේවාලය පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි මෙම ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය

යටතේ පරිපාලනය වන දේවාලවල බස්නායක නිලමේවරුන් සහ මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි දේවාලයක් සම්බන්ධයෙන් වන විට දියවඩන නිලමේ;

(iii) අදාළ දේවාලය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි, මෙම ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව පරිපාලනය කරනු ලබන සියලු සිද්ධස්ථානවල භාරකරුවන්;

(iv) මහනුවර නගර සීමාව තුළ පිහිටි සතර මහා දේවාල සම්බන්ධයෙන් වන විට, ඉහත සඳහන් (i), (ii) සහ (iii) යන ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන් ද මල්වතු හා අස්ගිරි පාර්ශ්වයන්හි මහානායක මාහිමිපාණන් වහන්සේලා ද ඇතුළු එම පාර්ශ්වවල විංශද්වර්ගික කාරක සංඝ සභාවල සාමාජික භික්ෂූන් වහන්සේලා;

(v) උඩරට පළාතේ පිහිටා නොමැති දේවාලයක් සම්බන්ධයෙන් වන විට, මෙම උපවගන්තියේ (i), (ii) සහ (iii) ඡේදවල නිශ්චිතව දක්වා ඇති අදාළ තැනැත්තන් ද එම දේවාලය පිහිටා ඇත්තේ කවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ද, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති විහාරස්ථානවල විහාරාධිපති ස්වාමීන් වහන්සේලා ද,

රැස්වීමක් සඳහා කැඳවිය යුතු ය.

(ආ) මෙම වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් තැනැත්තාට, එම රැස්වීම සම්බන්ධයෙන් ලිඛිත දැන්වීමක් එම රැස්වීම සඳහා නියම කරගත් දිනට එක් මාසයකට නොඅඩු කාලයකට පෙර, එම තැනැත්තා අවසන්වරට පදිංචිව සිටි ස්ථානයට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය.

(ඇ) තැපැල් දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය එසේ ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(ඈ) කොමසාරිස් - ජනරාල්වරයා විසින් මේ උපවගන්තියේ සඳහන් රැස්වීම, බස්නායක නිළමේ තනතුර නියමිත ධුර කාලය සම්පූර්ණ වීමෙන් පුරප්පාඩු වන්නේ නම් එසේ පුරප්පාඩු වීමේ දිනයට පූර්වයෙන් තෙමසක් ඇතුළත හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු වූයේ නම් එසේ පුරප්පාඩු වී තෙමසක් ඉක්මවීමට පෙර පැවැත්විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 8අ වගන්තිය ලෙස බලාත්මක වන්නේ ය.

"කිසිම බස්නායක නිළමේ ධුරයට පත් කරනු ලැබූ කිසිම තැනැත්තකු එම ධුරය දරන අතරතුර වෙනත් දේවාලයක බස්නායක නිළමේ ධුරය නොදැරිය යුතු බව.

8අ. දේවාලයක බස්නායක නිළමේ ලෙස පත් කරනු ලබන කිසිම තැනැත්තකු එම බස්නායක නිළමේ ධුරය දරන අතරතුර වෙනත් දේවාලයක බස්නායක නිළමේ ධුරය නොදැරිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ ඇති "මල්වතු විහාරය සහ අස්ගිරි විහාරය" යන වචන වෙනුවට "මල්වතු පාර්ශ්වය සහ අස්ගිරි පාර්ශ්වය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය එම වගන්තියේ අතුරු විධිනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"එසේ වුව ද, දියවඩන නිළමේගේ ධුර කාලය අවුරුදු පහක කාලසීමාවක් විය යුතු අතර, කිසිම තැනැත්තකු වාර තුනකට වඩා වැඩියෙන් දියවඩන නිළමේ තනතුරට තේරීපත් වීම සඳහා සුදුසුකම් නොලබන්නේ ය :

එසේම තවදුරටත්, මේ පනත ක්‍රියාත්මක වන දින දී දියවඩන නිළමේ තනතුර දරන තැනැත්තාගේ ධුරකාලය, ඔහු විසින් දෙවනවරට එම ධුරයේ කටයුතු භාරගත් දින සිට ආරම්භ වන අවුරුදු දහයක කාලයක් සඳහා විය යුතු ය.".

1981 අංක 18 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනතේ 3 වන වගන්තිය ඉවත් කිරීම.

**12.** 1981 අංක 18 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ ''වරදකට වරදකරු විය යුතු අතර, ලඝු කාර්ය පටිපාටිය මගින් වරදකරු කරනු ලැබීමේ දී ඒ එක් එක් උල්ලංඝනය කිරීම සඳහා රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.'' යන වචන වෙනුවට ''වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු කාර්ය පටිපාටිය අනුව පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (අ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

''(අ) භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් වූ විට හැර (සිය දේපළ උකස් කොට ගන්නා ලද ණයට ඉඩ හැර) ඔහු රුපියල් ලක්ෂ පනහකට නොඅඩු වටිනාකමක් ඇති නිශ්චල දේපළක අයිතිකරුවකු හෝ රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු පැහැදිලි වාර්ෂික ආදායමක් ලබන්නෙක් වේ නම් ද;'';

(2) එහි (ආ) ඡේදයේ ''නින්දිත අපරාධ'' යන වචන වෙනුවට ''යම් නීතියක් යටතේ වූ වෙනත් සාපරාධී වැරදි'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ ''ක්‍රියා කිරීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත්තේ ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

ක්‍රියා කිරීමට කොමසාරිස් - ජනරාල්වරයාට බලය ඇත්තේ ය. දියවඩන නිළමේවරයකු මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පැහැර හරින්නේ නම් හෝ බුද්ධ ශාසනයට හෝ දළදා මාළිගාවට අපකීර්තියක් ගෙන දෙන ආකාරයට කටයුතු කරන්නේ නම්, 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති

සාමාජිකයන් බහුතරයේ අනුමතය ඇතිව කොමසාරිස් - ජනරාල්වරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් අනතුරුව එම තැනැත්තා දියවඩන නිළමේ ධුරයෙන් ඉවත් කළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) එම නැවත අංකනය කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:—

''(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු ප්‍රකාරව දියවඩන නිළමේ තනතුර පුරප්පාඩු වූ අවස්ථාවක මල්වතු සහ අස්ගිරි පාර්ශ්වවල මහානායක මාහිමිපාණන් වහන්සේලා දෙනම විසින් නම් කරනු ලබන මහනුවර නගර සීමාව තුළ පිහිටි සතර මහා දේවාලවල බස්නායක නිළමේවරුන්ගෙන් එක් බස්නායක නිළමේවරයෙක් පුරප්පාඩු වූ දියවඩන නිළමේ තනතුරේ වැඩ බැලීම සඳහා පත් කළ යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, එම වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක තාවකාලික භාරකරුවකු පත් කිරීම.

17. (1) යම් භාරකාරයකු තනතුර භාරගැනීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක හෝ ඔහුගේ මරණය, නිලයෙන් අස්වීම, දුබලභාවය, නොහැකියාව, නුසුදුසුභාවය, අයෝග්‍යතාවය, නිලය අත්හැර දැමීම, නිලය තහනම් වීම, නිලයෙන් නෙරපා හැරීම හෝ වස්තු භංගත්වය, ඉල්ලා අස්වීම, සේවය අත්හිටුවීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, ඒ පුරප්පාඩුව සඳහා අනුප්‍රාප්තිකයකු පත් කරන තුරු ඒ තනතුරේ කටයුතු ඉටුකිරීම සඳහා තාවකාලික පත්කිරීමක් සිදුකිරීමට කොමසාරිස් - ජනරාල්වරයාට බලය තිබිය යුතු ය.

(2) (අ) කොමසාරිස් - ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන තාවකාලික පත් කිරීමක දී එම පත්කිරීම දේවාලයක් සඳහා වන අවස්ථාවක, ඒ සඳහා වෙනත් දේවාලයක බස්නායක නිළමේවරයෙක් හෝ භාරකාර ධුරයක් දරන්නකු පමණක් පත් කළ යුතු ය. විහාරාධිපති හිමියන් භාරකාර තනතුර දරන ලද විහාරස්ථානයක පුරප්පාඩුව ඇති වන අවස්ථාවක, අදාළ විහාරස්ථානය අයත් වන නිකායේ හෝ පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වහන්සේ විමසා තාවකාලික භාරකරුවකු පත්කළ යුතු ය. තව ද, එම පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත දී එසේ තාවකාලික භාරකරුවකු පත් කළ යුතු ය.

(ආ) තාවකාලික භාරකරුවකුට මෙම ආඥාපනත යටතේ භාරකරුවකුට ඇති සියලු බලතල තිබිය යුතු අතර, එම තැනැත්තා විසින් එම තනතුරට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතු ය.

(ඇ) මෙම වගන්තිය යටතේ පත් කරනු ලබන තාවකාලික භාරකරුවකු විසින් නියම කරනු ලබන යම් ඇප මුදලක් කොමසාරිස් - ජනරාල්වරයා වෙත තබනු ලැබිය යුතු ය.

(3) යම් භාරකරුවකු දිවයිනෙන් බැහැරව ගිය විට, ඒ භාරකරු විසින් ලියවිල්ලකින් නම් කරනු ලබන තැනැත්තකු එබඳු භාරකරු වෙනුවට ක්‍රියා කළ යුතු ය. එසේ නම් කිරීම පිළිබඳව එම භාරකරු කොමසාරිස් - ජනරාල්වරයාට වහාම ලිඛිතව දැන්විය යුතු ය.

(4) දියවඩන නිළමේ වෙනුවට වැඩ බැලීම සඳහා තැනැත්තකු තාවකාලිකව පත් කිරීමේ දී හෝ නම් කිරීමේ දී ඒ පත් කිරීම හෝ නම් කිරීම මල්වතු හා අස්ගිරි පාර්ශ්වයන්හි මහානායක මාහිමිපාණන් වහන්සේලා විසින් අනුමත කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ ''රුපියල් සියයකට වැඩි නොවන'' වන වචන වෙනුවට ''රුපියල් දසදහසකට නොවැඩි'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

''සිද්ධස්ථාන දේපළ විහාරාධිපති හෝ පාලක විහාරාධිපති වෙත පැවරිය යුතු බව.

20අ. 2015 අංක දරන ථෙරවාද බෞද්ධ කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනතේ 10 වන වගන්තිය යටතේ කාරක සංඝ සභාව විසින් ගන්නා ලද තීරණයකට අනුකූලවීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින යම් විහාරාධිපති ස්වාමීන් වහන්සේ නමක් හෝ පාලක විහාරාධිපති නමක් එම තීරණයේ දින සිට එක් මාසයක් ඇතුළත දී, සිද්ධස්ථාන දේපළෙන් ඉවත් විය යුතු ය. මේ පනතේ විධිවිධානවලට අනුව කාරක සංඝ සභාව විසින් අවස්ථාවෝචිත පරිදි, එම නිකාය හෝ පාර්ශ්වයේ ම වෙනත් විහාරාධිපති ස්වාමීන් වහන්සේනමක් හෝ පාලක විහාරාධිපතිනමක් පත් කරනු ලැබිය යුතු අතර සිද්ධස්ථාන දේපළ, එම යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් දැනටමත් බලපාන යම් බද්දක්, කුලී ගිවිසුමක්, බැඳීමක් සහ යම් බාධකයකට යටත් ව එම විහාරාධිපති හෝ පාලක විහාරාධිපති වෙත පවරනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''සිය පාවිච්චිය සඳහා භික්ෂූන් වහන්සේ නමක් විසින් අත්පත් කරගනු ලබන පෞද්ගලික දේපළ.

23ආ. භික්ෂූන් වහන්සේනමක් විසින් සිය අනන්‍ය පෞද්ගලික පාවිච්චිය සඳහා අත්පත් කරනු ලබන සියලු චංචල සහ නිශ්චල පුද්ගලික දේපළ, එම භික්ෂූන් වහන්සේ විසින් සිය ජීවිත කාලය තුළ දී බැහැර කොට නොමැති නම් හෝ එම භික්ෂූන් වහන්සේ උපැවිදි වන්නේ නම් එවැනි අවස්ථාවක,

එසේ උපවැදි වීමට පෙර එම දේපළ බැහැර කොට නොමැති නම්, එම දේපළ එම භික්ෂූන් වහන්සේ විසින් පරම්පරාවෙන් උරුමකරගත් දේපළක් නම් මිස, එම දේපළ එම භික්ෂූන් වහන්සේ වාසය කළ සිද්ධස්ථානයේ දේපළක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය එහි (3) වන උපවගන්තියේ ''රුපියල් සියයකට වැඩි කවර හෝ මුදලක්'' යන වචන වෙනුවට ''රුපියල් ලක්ෂයකට වැඩි කවර හෝ මුදලක්'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''පරවේණි දේපළ පිළිබඳ අයිතිවාසිකම් පැවරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

27. (1) පරවේණි දේපළක යම් අයිතිවාසිකමක් පැවරීමට යම් පරවේණි නිලකරුවකු බලාපොරොත්තුවන අවස්ථාවක, ඒ බව, 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයක් නම්, භාරකරුට ද, වෙනත් යම් විහාරස්ථානයක් නම් විහාරාධිපති ස්වාමීන් වහන්සේට ද පිටපතක් සහිතව කොමසාරිස් - ජනරාල්වරයාට සිය අදහස දන්වා ඒ සඳහා කොමසාරිස් - ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ලබාගත යුතු ය.

(2) ඉන්පසු කොමසාරිස්-ජනරාල්වරයා විසින්-

(අ) පැවරීමට ඇති අයිතීන් පරවේණි දේපළක් පිළිබඳ අයිතිවාසිකම් බවට හෝ එහි කොටසක් බවට සෑහීමට පත්වීමෙන් පසු අනුමතය ප්‍රදනය කළ හැකි අතර, එම අනුමතයේ පිටපතක් අදාළ සිද්ධස්ථානයේ භාරකරු වෙත යවනු ලැබිය යුතු ය ; හෝ

(ආ) අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අතර, එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ඒ සඳහා හේතු ද සමග ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) කොමසාරිස්-ජනරාල්වරයා විසින් මේ වගන්තිය යටතේ ඔහු විසින් ප්‍රදානය කරන ලද අනුමතයන් හෝ අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ලේඛනයක පවත්වාගෙන යා යුතු ය.

(4) කොමසාරිස්-ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් පරවේණි නිලකරුවෙකු එම තීරණයේ දින සිට මාසයක් ඇතුළත එම තීරණයට එරෙහිව බෞද්ධ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා කළ හැකි ය.

(5) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරවේණි නිලකරුවෙකු විසින් එම පරවේණි දේපළ පිළිබඳ සිය අයිතිවාසිකම් පැවරීමට පෙරාතුව කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ලබාගැනීම පැහැර හරිනු ලැබුවහොත්, එම නිලකරු වරදකට වරදකරු වන අතර, ලඝු කාර්ය පටිපාටිය අනුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන අතර, එම දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් ඒ වෙනුවට මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

(6) යම් පරවේණි දේපළක පරවේණි නිලකරුවකුගේ එම දේපළ සම්බන්ධ අයිතිවාසිකම් පැවැරීම සඳහා කොමසාරිස්-ජනරාල්වරයා විසින් අනුමතය ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී, පැවැරුම් ඔප්පුව ලියා අත්සන් කිරීමෙන් පසු එම පැවැරුම් ඔප්පුවේ සහතික පිටපතක් කොමසාරිස්-ජනරාල්වරයාගේ දැනගැනීම සඳහා පරවේණි නිලකරු විසින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු අතර, කොමසාරිස්-ජනරල්වරයා විසින් ඒ බව එම දේපළ භාරයක් ලෙස දරන සිද්ධස්ථානයේ භාරකරුවන් වෙත දැනුම් දිය යුතු ය.”.

28අ වගන්තිය සිට 28ඕ වගන්තිය දක්වා වූ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම වගන්ති 28අ, 28ආ, 28ඇ, 28ඈ, 28ඉ, 28ඊ, 28උ, 28ඌ, 28එ, 28ඒ, 28ඔ සහ 28ඕ යන වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :—

''අනවසර සන්තනය දැරීමෙන් හෝ අනවසර පදිංචියෙන් සිද්ධස්ථානයේ දේපළ ආපසු ලබාගැනීම.

28අ. (1) යම් සිද්ධස්ථානයකට අයත් වන්නා වූ හෝ අයත් වන බවට සලකනු ලබන යම් දේපළක අනවසර ලෙස පදිංචි වී සිටින හෝ අනවසර ලෙස සන්තකය දරමින් සිටින යම් තැනැත්තකුගෙන් එකී දේපළ ආපසු ලබා ගැනීම සඳහා අදාළ වන්නා වූ කාර්ය පටිපාටිය මෙහි පහත නිශ්චිතව දක්වා ඇති ආකාරයට විය යුතු ය:

එසේ වුව ද, අදාළ දේපළෙහි අනවසර පදිංචිය හෝ සන්තකයේ සිටින අය ඉවත් කර දෙන ලෙස ඉල්ලා අදාළ සිද්ධස්ථානයේ භාරකරු හෝ පාලක විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ හැක්කේ ය.

එසේම තවදුරටත්, (1) වන උපවගන්තියේ විධිවිධාන පරවේණි පංගුවට සහ (118 වන අධිකාරය වූ) සන්නස් සහ පැරණි ඔප්පු ආඥාපනතේ බැහැර කරනු ලබන යම් දේපළ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඔහුගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබූ යම් සහතිකයක් එම සහතිකයේ සඳහන් තැනැත්තා අනවසර ලෙස සන්තකය දරා සිටින බවට හෝ අනවසර ලෙස පදිංචි වී සිටින බවට එම සහතිකයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් යම් සිද්ධස්ථානයකට අයත් දේපළක සන්තකය දැරීම හෝ පදිංචිව සිටින

සෑම අවස්ථාවක දී මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව පැවති බවටත් යටත් වන බවටත් සැලකිය යුතු ය.

ඉවත්වයෑමේ දැන්වීමට අනුකූලවීම සඳහා වන යුතුකම.

28ආ. (1) (අ) යම් තැනැත්තකු යම් සිද්ධස්ථානයකට අයත් දේපළක අනවසර ලෙස සන්තකය දරමින් සිටින බව හෝ අනවසර ලෙස පදිංචි වී සිටින බව කොමසාරිස්-ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, කොමසාරිස්-ජනරාල්වරයා විසින් සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා වෙත (මෙහි මින්මතු "ඉවත්ව යාමේ දැන්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැන්වීමක් භාර දෙමින් එම දැන්වීම මගින් එම තැනැත්තාට සහ ඔහුට යැපෙන්නන් සිටී නම් එම යැපෙන්නන් එම දේපළෙන් ඉවත්ව යා යුතු බවටත්, යම් නිශ්චිත දිනයක දී හෝ එදිනට පෙර කොමසාරිස්-ජනරාල්වරයා වෙත හෝ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන පරිදි ඔහු විසින් බලය පවරන යම් තැනැත්තකු වෙත එම දේපළේ නිරවුල් සන්තකය භාරදෙන ලෙසත් එම දැන්වීම මගින් නියම කරනු ලැබිය යුතු ය.

(ආ) එම දැන්වීම නිශ්චිත දක්වනු ලබන දිනය එම දැන්වීම නිකුත් කළ දිනයේ සිට හෝ එම දැන්වීම ප්‍රදර්ශනය කළ දින සිට දින හැටකට නොඅඩු දිනයක් විය යුතු ය.

(2) යම් සිද්ධස්ථානයකට අයත් දේපළක් සම්බන්ධයෙන් වූ ඉවත්ව යාමේ දැන්වීමක්, එම දැන්වීම ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබුවහොත් එම දේපළේ සන්තකය දරන හෝ එහි පදිංචිව සිටන තැනැත්තා වෙත භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සෑම ඉවත්ව යාමේ දැන්වීමක් ම මෙහි උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය අනුව විය යුතු ය.

ඉවත්වයාමේ දැන්වීමකට අනුකූලව ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලය.

28ඇ. 28 ආ වගන්තිය යටතේ ඉවත්වයාමේ දැන්වීමක් භාරදෙනු ලැබූ හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක-

(අ) දේපළේ අනවසර සන්තකය දරන හෝ එහි පදිංචිව සිටින එම දැන්වීම අදාළ වන යම් තැනැත්තකුට හෝ එම තැනැත්තාගෙන් යැපෙන තැනැත්තාට එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයට පසුව එම දේපළේ සන්තකය දැරීමට හෝ එහි පදිංචිව සිටීමට හිමිකමක් නොතිබිය යුතු ය ; සහ

(ආ) එම දේපළේ අනවසර සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා සහ ඔහුට යැපෙන්නන් සිටී නම් එම යැපෙන්නන් එම ඉඩමෙන් ඉවත් වී එහි නිරවුල් සන්තකය කොමසාරිස්-ජනරාල්වරයාට හෝ ඔහු විසින් බලය පවරා ඇති සහ එම දැන්වීමේ නම සඳහන් තැනැත්තාට භාර දිය යුතු ය.

ඉල්ලීමේ නම සඳහන් තැනැත්තා විසින් නිදහසට හේතු ඉදිරිපත් කළ යුතු බවට නියම කරන දැන්වීමක් මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කළ යුතු බව.

28ඇ. (1) යම් සිද්ධාන්තයකට අයත් දේපළක අනවසර සන්තකය දරන හෝ පදිංචිව සිටින යම් තැනැත්තෙක් මෙහි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව නිකුත් කරන ලද ඉවත්වයාමේ දැන්වීමක් සම්බන්ධයෙන් 28ඇ වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස්-ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු හෝ විසින්-

(අ) එම ඉල්ලීමෙහි පහත දැක්වෙන කරුණු සඳහන් කරමින්, එනම්––

(i) මෙම ආඥාපනතේ කාර්ය සඳහා බලය පවරා ඇති තැනැත්තා තමා බව ;

(ii) ඉල්ලීමේ උපලේඛනයේ විස්තර කර ඇති දේපළ සිද්ධස්ථානය සතු දේපළක් බව ;

(iii) එම දේපළේ අනවසර සන්තකය දරා සිටින හෝ අනවසරයෙන් පදිංචිව සිටින තැනැත්තා වෙත ඉවත්ව යාමේ දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් යවන ලද බව නැතහොත් එවැනි දැන්වීමක් එම දේපළේ හෝ එය මත ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන ලද බව ;

(iv) එම ඉල්ලීමේ නම සඳහන් තැනැත්තා එම දේපළේ අනවසරයෙන් සන්තකය දරන බව හෝ අනවසරයෙන් පදිංචිව සිටින බව සහ එම දේපළට අදාළ දැන්වීම සම්බන්ධයෙන් 28ඇ වගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බව ; සහ

(ආ) එම දේපළේ සන්තකය ආපසු ලබාදෙන ලෙස අයැද සිටීම සහ එම දේපළේ අනවසර සන්තකය දරන හෝ එහි අනවසරයෙන් පදිංචි වී සිටින තැනැත්තා සහ ඔහුගෙන් යැපෙන්නන් එම දේපළෙන් නෙරපීම සඳහා වූ ආඥාවක් අයැද සිටිමින්,

එම දේපළ හෝ එහි යම් කොටසක් පිහිටා ඇති ඒ පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත මෙහි උපලේඛනයේ "ආ" ආකෘති පත්‍රයට සාරානුකූලවන ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ එවැනි සෑම ඉල්ලීමක්ම එම ඉල්ලීමේ සඳහන් කරුණු සත්‍යයානය කරමින් මෙහි උපලේඛනයේ "ඇ" ආකෘති පත්‍රයට සාරනුකූලව වූ දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරනු ලැබිය යුතු අතර, ඉවත්ව යාමේ දැන්වීමක් ද ඒ සමග විය යුතු ය.

(3) දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරනු ලැබූ සෑම ඉල්ලීමක් සහ මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන යටතේ වන ඉවත්ව යාමේ දැන්වීමේ පිටපතක් "නෙරපීම සඳහා වූ ඉල්ලීමක්" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) නෙරපීම සඳහා වූ ඉල්ලීමක් සඳහා මුද්දර ගාස්තු අයකරනු නොලැබිය යුතු ය.

නිදහසට කරුණු දක්වා නොමැති අවස්ථාවක නෙරපීම සඳහා ආඥාව.

28ඉ. (1) 28 ඈ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලැබීමේ දී මහෙස්ත්‍රාත්වරයා විසින් එම ඉල්ලීමේ නම සඳහන් තැනැත්තා වෙත වහාම සිතාසි නිකුත් කරමින් නෙරපීම සඳහා වූ දැන්වීමේ අයැද ඇති පරිදි ඉල්ලීමේ නම සඳහන් තැනැත්තා සහ ඔහුගෙන් යැපෙන්නන් සිටී නම් එම යැපෙන්නන් දේපළෙන් නෙරපීම නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව එම සිතාසියේ නිශ්චිතව දක්වා ඇති (එම සිතාසි නිකුත් කළ දින සිට සති දෙකකට නොඅඩු කාලයක් වන) දිනයක දී, අධිකරණයේ පෙනී සිට නිදහසට කරුණු දැක්විය යුතු බවට එම සිතාසියේ සඳහන් කර කර තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති සිතාසි නිකුත් කිරීම සම්බන්ධයෙන්, ඒවා භාරදීම සම්බන්ධයෙන් සහ සිතාසි අනුව එම තැනැත්තා පැමිණෙන බවට සහතික වීම සඳහා අවශ්‍ය වෙනත් පියවර සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ඒ සඳහා අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු ය.

නිදහසට කරුණු ඉදිරිපත් කරනු ලැබුවහොත් විමසීම පැවැත්වීම.

28ඊ. (1) 28ඉ වගන්තිය යටතේ සිතාසි නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තා එම සිතාසියේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී අධිකරණයට පැමිණ නෙරපීමේ ආඥාවක් නිකුත් කිරීමට එරෙහිව තමාට නිදහසට කරුණු ඇති බව ප්‍රකාශ කළහොත්, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වහාම එම නඩුව විභාගකර තීරණය කිරීම

සඳහා කටයුතු කළ හැකි අතර, නැතහොත් නඩු විභාගය මතු දිනයක් සඳහා නියම කරනු ලැබිය හැකි ය.

(2) නෙරපීම සඳහා වූ යම් ඉල්ලීමක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක, එම අධිකරණයේ වෙනත් නඩු කටයුතු කලින් ඉටු කිරීම අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන අවස්ථාවක හැර, එම අධිකරණයේ වෙනත් නඩු කටයුතුවලට වඩා මෙම ඉල්ලීම අසා තීරණය කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

නෙරපීමේ ආඥාව.

28උ. විමසීමෙන් පසු නිදහසට කරුණු ඉදිරිපත් කළ තැනැත්තාට එම දේපළේ සන්තකය දරා සිටීමට හෝ පදිංචිව සිටීමට හිමිකමක් ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවන්නේ නම්, එම තැනැත්තා සහ ඔහුගෙන් යැපෙන්නන් එම දේපළෙන් නෙරපිය යුතු බවට විධාන කරමින් මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය.

නෙරපීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීම.

28ඌ. (1) 28උ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද ආඥාවකට අනුකූලව ක්‍රියාකිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත එම දේපළෙන් එම ආඥාවෙන් බැඳී සිටින සියලු තැනැත්තන් නෙරපන ලෙස සහ එම දේපළේ නිරවුල් සන්තකය කොමසාරිස් ජනරාල්වරයාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට භාර දෙන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පිස්කල්ට හෝ පොලිස් නිලධරයකු විධාන කරනු ලැබිය යුතු ය.

(2) නෙරපීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීම සඳහා බලය පවරා ඇති පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් එම ආඥාව කරනු ලැබූ මහෙස්ත්‍රාත්

අධිකරණයේ විධානයට අනුකූලව ක්‍රියාකරමින් තමා එම ආඥාව ක්‍රියාවේ යෙදවූ ආකාරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) නෙරපීම සඳහා වූ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේ දී පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් නැතහොත් පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් අවශ්‍ය බලය පාවිච්චි කරමින් එම දේපළට ඇතුළු වී එම ආඥාවෙන් බැඳී සිටින තැනැත්තා නෙරපා එම මහෙස්ත්‍රාත් අධිකරණයේ විධානයට අනුකූලව දේපළේ සන්තකය භාරදිය යුතු ය.

කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව අයිතිය තහවුරු කිරීමට නඩුවක් පවත්වාගෙන යා හැකි බව.

28එ. මේ පනතේ සඳහන් කිසිවක් මගින් යම් දේපළකින් නෙරපනු ලැබූ යම් තැනැත්තෙක් හෝ එම දේපළේ අයිතිකරු බවට හිමිකම්පාන යම් තැනැත්තෙක් එම නෙරපීමේ ආඥාවේ දින සිට මාස හයක් ඇතුළත දේපළ සඳහා තමාට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා කොමසාරිස්-ජනරාල්වරයාට හෝ ඔහු වෙනුවට කටයුතු කළ වෙනත් යම් තැනැත්තකුට එරෙහිව නඩුවක් පැවරීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

වන්දි.

28ඒ. මේ පනත යටතේ තමා නෙරපනු ලැබූ යම් දේපළක අයිතිය තහවුරු කිරීම සඳහා කොමසාරිස්-ජනරාල්වරයාට එරෙහිව යම් තැනැත්තකු විසින් 28එ වගන්තිය යටතේ පවරන ලද නඩුවක් එම තැනැත්තාගේ වාසියට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී එම දේපළේ සන්තකය භාරදීමට සිදුවීම මගින් සිදු වූ අලාභය සඳහා සාධාරණ වන්දි මුදලක් අයකර ගැනීමට එම තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

විහාර දේපළ ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් වන විධිවිධාන වෙනත් නීති අභිබවා ක්‍රියාත්මක විය යුතු බව.

28ඔ. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, විහාර දේපළ ආපසු ලබා ගැනීම සඳහා අදාළ විධිවිධාන සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මෙම විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති වූ විට මෙම විධිවිධාන බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි "රුපියල් පන්සියයකට නොවැඩි සහ අක්කර පහකට නොවැඩි'' යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ පහකට නොවැඩි හෝ අක්කරයකට නොවැඩි" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

> "(3) යම් බදු දීමක් කිසිම අවස්ථාවක අවුරුදු තිහක කාලයක් නොඉක්මවිය යුතු අතර, එසේ අවුරුදු තිහක කාලයක් සඳහා වන සෑම බදු දීමක් සඳහා ම බද්ද පටන් ගත් දින සිට සෑම අවුරුදු පහකට වතාවක්ම එහි බදු මිල ප්‍රතිශෝධනය කළ අතර, ඒ බවට ප්‍රතිඥාවක් බදු ගිවිසුමේ ඇතුළත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසීයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු කාර්ය පාටිපාටිය අනුව පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය එහි (3) වන උපවගන්තියේ "වරදකට වරදකරු විය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසීයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු කාර්ය පටිපාටිය අනුව පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට යටත්විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් දෙසීයට වැඩි" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ දෙකකට වැඩි" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''ආඥාපනත යටතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම්.

40. පවත්නා ථෙරවාද බෞද්ධ විනය හා චාරිත්‍රවිධිවලට අනුකූලව පත් කරනු ලබන බෞද්ධාගම්කාරයකු වේ නම් සහ වයස අවුරුදු දහ අට සම්පූර්ණ කොට ඇත්නම් මිස අටමස්ථාන සභාවේ සාමාජිකයකු වීම හෝ එම සභාව සඳහා යම් සාමාජිකයකු ලෙස නම් කිරීම හෝ සිද්ධස්ථානයක භාරකරුවකු වීම සඳහා හිමිකම් නොලැබිය යුතු ය:

එසේ වුව ද, සිද්ධස්ථානයක භාරකරුවකු තෝරාපත් කර ගැනීමේ දී ඒ සඳහා ඡන්දය දීමට වයස අවුරුදු දහ අට සම්පූර්ණ කොට ඇති ඕනෑම බෞද්ධ ආගමික පුරුෂයකුට හෝ ස්ත්‍රියකට හිමිකම් ලැබිය යුතු ය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එසේ උපසම්පදාවීමෙන් හෝ පැවිදිවීමෙන් පසු මාසයක් ඇතුළත " යන වචන වෙනුවට "උපසම්පදා වීමෙන් හෝ පැවිදිවීමෙන් පසු මාස තුනක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධන කරනු ලැබේ.

(ආ) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :—

"(7) මේ වගන්තියේ විධිවිධාන පැහැර හරින හෝ උල්ලංඝනය කරමින් කටයුතු කරන සෑම උපසම්පන්න භික්ෂූන් වහන්සේනමක්, විහාරාධිපති භික්ෂූන් වහන්සේනමක් හෝ පැවිදිකරන ආචාර්ය භික්ෂූන් වහන්සේනමක් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයක්" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසකට නොවැඩි දඩයක් " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 43වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

(ඊඅ) මෙම ආඥාපනත ප්‍රකාරව පත්කිරීමට නියමිත භාරකරුවන් සඳහා පත්වීම් ලිපිවල ආකෘතිය නියම කරමින්;

(ඊආ) මෙම ආඥාපනතේ 14 වන වගන්තියේ නිශ්චිත ව දක්වා ඇති යම් නුසුදුසුකමකට භාරකරුවන් යටත් නොවන බවට ප්‍රකාශ කරමින් භාරකරුවන් විසින් ප්‍රකාශයක් කළ යුතු බවට නියම කරමින්;

(ඊඇ) භාරකරුවන් විසින් ලබාදිය යුතු ඇප මුදල් ප්‍රමාණය නියම කරමින් සහ එම ඇපය තැන්පත් කිරීමේ ක්‍රමය නියම කරමින්;

(ඊඈ) පරවෙණි දේපළේ නැතහොත් එම දේපළේ කොටසක පැවැරුම්ලාභියා විසින් ඉටුකළ යුතු කාර්යභාරයට අදාළ ව පවත්වාගෙන යායුතු ලේඛන නියම කරමින්;

(ඊඉ) උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍ර සංශෝධනය සහ අලුත් ආකෘති පත්‍ර නියම කරමින්.

(2) එහි (උ) ඡේදය, ඉවත් කිරීමෙන්,

(3) එම වගන්තියේ (2) සහ (3) උපවගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයේ නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් අනතුරුව හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක්, එම නියෝගය යටතේ ඊට පෙර සිදුකරන ලද කිසිම දෙයකට අගතියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කළ ලෙස සලකනු ලබන දිනය දැන්වීමක් මගින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය."

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 43අ වගන්තිය ලෙස බලාත්මක වන්නේ ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

''43 වන වගන්තිය යටතේ වැරදි.

43අ. 43 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියෝග කඩ කරන හෝ එම නියෝගවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය. ඔහු එම වරද නොකඩවා කරනු ලබන්නේ නම් ඔහු විසින් එම වරද කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩයකට යටත් වන්නේ ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**33.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය**

(28ආ වගන්තිය)

"අ" ආකෘතිය

**ඉවත්ව යාමේ දැන්වීම**

සිද්ධස්ථානයට හිමි ඉඩම් විහාර සහ දේවාලගම් ආඥාපනතේ කාර්ය සඳහා නම සඳහන් (බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා හෝ නිසි බලධරයා) වන මම.............................................................................................................

...............................................................................................වන ඔබ (නම සඳහන් කරන්න) මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමේ* / අනවසරයෙන් සන්තකය දරන බවට / අනවසරයෙන් පදිංචිව සිටින බවට විශ්වාස කරන බැවින් මේ පනතේ 28ඈ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර.......................................................................................... වන* ඔබට (නම සඳහන් කරන්න)

(අ) ඔබේ යැපෙන්නන් සිටින්නේ නම් එම යැපෙන්නන් සමග ඉහත කී ඉඩමෙන් මේ දැන්වීමේ සඳහන් දින සිට දින....................................ඇතුළත ඉවත් වන ලෙසත්;

(ආ) ............................................................දින හෝ එදිනට පෙර ඉහත කී ඉඩමේ නිරවුල් සන්තකය මේ පනතේ කාර්ය සඳහා වන නිසි බලධරයා වන මා වෙත හෝ මා විසින් ඒ සඳහා බලය පවරන ලද බලයලත් නිලධරයා වන .......................................වෙත භාරදෙන ලෙසත්,

මෙයින් නියම කරමි.

..............................................................

කොමසාරිස් ජනරාල්වරයා හෝ
නිසි බලධරයාගේ අත්සන
තනතුරක් ඇත්නම් එම තනතුර.

ඉහත සඳහන් උපලේඛනය:
(දිස්ත්‍රික්කයේ නම ඇතුළු පිහිටීම සඳහන් කරමින් ඉඩම විස්තර කරන්න)

..............................................................

කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන.

දිනය..................................................

*අදාළ නැත්නම් කපා හරින්න.

(28ඇ වගන්තිය)

"ආ" ආකෘතිය

**නෙරපීම සඳහා වූ ඉල්ලීම**

.........................................................................................මහෙස්ත්‍රාත් අධිකරණ වෙත
(අධිකරණයේ නම සඳහන් කරන්න)
සිද්ධස්ථානය සතු දේපළ විහාර සහ දේවාලගම් ආඥා පනතේ කාර්ය සඳහා කොමසාරිස්-ජනරාල්වරයා වන.......................................................................................(නම සඳහන් කරන්න) වන මම, පනතේ 28ඇ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මේ ඉල්ලීම මගින්-

(අ) පහත දැක්වෙන කාරණා සඳහන් කරමින් එනම්-

(i) නිසි බලධරයා මම වෙමි;

(ii) මේ ඉල්ලීමේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම .........................................................(ඉඩම අයිතිය සිද්ධස්ථානයේ නම සහ ලිපිනය) ට අයත් ඉඩමකි;

(iii) (ඉල්ලීමට පිටපතක් අමුණා ඇති) ඉවත්ව යාමේ දැන්වීම ...........................................(නම සහ ලිපිනය සඳහන් කරන්න) වෙත *භාරදුන් බව / එම ඉඩමේ ප්‍රදර්ශනය කළ බව;

(iv) ඉහත කී .............................................................................. (නම සඳහන් කරන්න) ඉඩමේ *අනවසර සන්තකයේ සිටින බව / අනවසරයෙන් පදිංචිව සිටින බවත් මේ පනතේ 28ඇ වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම.

(ආ) ඉහත කී ඉඩමේ සන්තකය ආපසු ලබදෙන ලෙස අයැද සිටිනු ලබන බවත් එකී ඉඩමෙන් (නම සඳහන් කරන්න) නමැති අය සහ ඔවුන්ගෙන් යැපෙන්නන් සිටී නම් එම යැපෙන්නන් නෙරපන ලෙස අයැද සිටින බවත් ය.

...............................................................
කොමසාරිස් ජනරාල්වරයා හෝ
නිසි බලධරයාගේ අත්සන සහ
තනතුරක් ඇත්නම් එම තනතුර.

ඉහත සඳහන් උපලේඛනයː
(ඉඩම පිහිටි දිස්ත්‍රික්කය ඇතුළු ඉඩමේ පිහිටීම විස්තර කරන්න)

...............................................................
කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ
නිසි බලධරයාගේ අත්සන.

දිනය...................................................

* අදාළ නොවන්නේ නම් කපා හරින්න.

(28ඈ වගන්තිය)

"ඈ" ආකෘති පත්‍රය

**දිවුරුම් ප්‍රකාශය**

.........................................................................................මහෙස්ත්‍රාත් අධිකරණ වෙත(එම අධිකරණයේ නම සඳහන් කරන්න) නම සහ තනතුරක් ඇත්නම් එය සඳහන් කරන්න ......................................................................................... වන මම, විහාර සහ දේවාලගම් ආඥා පනතේ 28ඈ වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි ගාම්භීරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත් පහත සඳහන් පරිදි ප්‍රකාශ කර *ප්‍රතිඥ දෙමි / දිවුරා ප්‍රකාශ කරමිː-

(i) මේ පනතේ කාර්ය සඳහා නිසි බලධරයා මම වෙමි;

(ii) නෙරපීම සඳහා වූ ඉල්ලීමේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සිද්ධස්ථානය සතු ඉඩමක් බවත්;

(iii) (නෙරපීම සඳහා වූ ඉල්ලීමේ පිටපතක් අමුණා ඇති) ඉවත්ව යාමේ දැන්වීමක් ............................................... (අනවසර සන්තකය දරන්නාගේ නම හා ලිපිනය) වෙත භාරදුන් බවත් *එම ඉඩමේ ප්‍රදර්ශනය කරනු ලැබූ බවත් ;

(iv) ඉහත කී .............................................................................. (නම සඳහන් කරන්න) ඉහත කී ඉඩමේ* අනවසරයෙන් සන්තකයේ සිටින බවත් / පදිංචිව සිටන බවත් මේ ආඥා පනතේ 28ඈ වන වගන්තිය "ආ" ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවත් ය.

...............................................................

දිවුරුම් ප්‍රකාශකගේ අත්සන.

(තනතුරක් ඇත්නම් තනතුර)

20.................. දින දිවුරුම් ප්‍රකාශක විසින් මා ඉදිරිපිට දී ප්‍රතිඥ දෙන ලදී. දිවුරුම් දෙන ලදී

...............................................................

ප්‍රතිඥව හෝ දිවුරුම් ලබාදුන් තැනැත්තාගේ අත්සන සහ තනතුරක් ඇත්නම් එම තනතුර

*අදාළ නැති කොටස් කපා හරින්න.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.